# පෙරවදන

ස්වයංරකියා ව්‍යාපෘතීන් හි මූලික අරමුණක් වන්නේ දිළිඳුබවේ සීමාවට පහළින් සිටින ජන කොටස්වල ආදායම් වැඩිකර ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීමයි. ස්වයංරකියා සෘජුවම ආදායම සහ වත්කම් වෙනස්වීමට බලපාන අතර වක්‍ර ලෙස මානව සහ සමාජ ප්‍රාග්ධනයෙ හි වෙනස්වීමට බලපෑමක් ඇති කරයි. ඒ තුළ ඉහළ ආදායම, ඉහළ ඉතිරි කිරීම, වැඩි ආයෝජනය, වැඩි ඵලදායිතාවය, උසස් සමාජ ආර්ථික තත්ත්වය සහ ධනාත්මක ආකල්ප සහිත පුද්ගලයින් බිහි වේ. ඒ අනුව, සාර්ථක ආදායම් උත්පාදන ස්වයංරකියා ව්‍යාපෘති පුද්ගලයින්ගේ ජීවනෝපාය සංවර්ධනය කරමින් සමාජ සජීවිකරණය සඳහා දායක වේ. මෙය රටක ආර්ථික සංවර්ධනයෙහි ලා බෙහෙවින් උපකාරි වේ. ස්වයංරකියා ව්‍යාපෘති මඟින් සමාජයට ප්‍රයෝජනවත් වැඩදායී පුද්ගලයින් එක් කරන අතර මේ මඟින් ජාතිය ගොඩනැඟීමට සැලකිය යුතු දායකත්වයක් සැපයේ.

මහින්ද චින්තන සංවර්ධන ක්‍රියාදාමය හා සබැඳි අපි වවමු - රට නඟමු දැවැන්ත ජාතික වැඩපිළිවෙළෙ හි කෘෂිකර්මය ආශ්‍රිත තරුණ දායකත්වය ඉහළ නැංවීම මුල්කොට පොළොන්නරුව දිස්ත්‍රික්කය ආශ්‍රිතව ක්‍රියාත්මක වූ ස්වයංරකියා උත්පාදන වැඩසටහන් හි ප්‍රගතිය පිළිබඳ අධ්‍යයනයක් කොට වාර්තාවක් ලබාදෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශය ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන ආකාරයට සමස්ත ස්වයංරකියා ලාභීන්ගෙන් 83%ක් අධ්‍යයනයට භාජනය කොට තොරතුරු රැස් කරන ලදී. සාර්ථක ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාග්ධනය, තාක්ෂණය වැනි සාධුබලයන් ලබාදීමට එම ව්‍යාපෘතීන් හි තිරසාර භාවය සඳහා අවශ්‍ය බව අධ්‍යයනයෙන් නිර්දේශ කොට ඇත. ස්වයං රකියා ව්‍යාපෘතීන් නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම එකී ව්‍යාපෘතීන් සාර්ථක වීමට සෘජුවම බලපාන බව මෙම අධ්‍යයනය මඟින් සනාථ වේ.

මෙම අධ්‍යයනය එවැනි සංවර්ධන ක්‍රියාවලිවල අරමුණ සහ ඉලක්කගත ක්‍රියාදාමය සඳහා ඉතා හොඳ මඟ පෙන්වීමකි. එසේ වීමට හේතුව එවන් ව්‍යාපෘතීන් හි අරමුණු සපුරා ගැනීම සඳහා පුද්ගලයින්ගේ ආර්ථික අවශ්‍යතා හඳුනාගෙන ඒ පිළිබඳව ගවේෂණය කර, එම අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා සවිබලකරණයක් කළ යුතු වන බැවිනි. ඒ අනුව, පුහුණුව සහ ආකල්පමය වර්ධනය තුළින් පුද්ගලයන් සතු ආත්ම විශ්වාසය ගොඩනැඟීම ද ස්වයංරකියා ව්‍යාපෘති හේතුවන බව මෙම අධ්‍යයනය තුළින් පෙන්වා දී ඇත.

දේශීය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රගමනය අරමුණු කොටගත් ස්වයංරකියා මෙන් ම ආදායම් උපයන ව්‍යාපෘතීන් හි ක්‍රියාකාරිත්වය ආශ්‍රිත බොහෝ අධ්‍යයන ප්‍රයත්නයන්ට මෙන් ම ප්‍රතිපත්ති සම්පාදනයට මෙවැනි විරල අධ්‍යයනයන් හේතු වනු ඇතැයි මම විශ්වාස කරමි.

ඊ.එම්. අභයරත්න
අධ්‍යක්ෂ

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගා,ප.පු.ආ
HARTI